# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2124/42 - 2019 මැයි මස 24 වැනි සිකුරාදා - 2019.05.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මා විසින් (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර 2018 පෙබරවාරි මස 02 වන දින අංක 2056/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කෙරුණු නිවේදනයෙන් 2018 ජනවාරි මස 31 වන දින පිහිටුවන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2018 ජනවාරි මස 31 වැනි දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී සී/ස. ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම, සී/ස. ශ්‍රී ලංකන් කේටරිං සමාගම සහ සී/ස. මිහින් ලංකා (පුද්ගලික) සමාගම සම්බන්ධයෙන් සිදු කරන ලදැයි කියන අක්‍රමිකතා පිළිබඳව විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ තත් කාර්යයන් ඉටුකර එහි අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතු වන්නාවූ 2018 ජූලි මස 31 වන දිනෙන් අවසන් වන මාස හයක කාලය, එකී පනතෙහි 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2018 ජූලි මස 31 වන දින අංක 2082/3 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයක් මගින් 2018 ජූලි මස 31 දින සිට මාස පහකින්, එනම් 2018 දෙසැම්බර් මස 31 වන දින දක්වා දීර්ඝ කරන ලදුව, නැවත වතාවක් එකී බලතල ප්‍රකාරවම, 2018 නොවැම්බර් මස 30 වන දින අංක 2099/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයක් මගින් 2019 පෙබරවාරි මස 15 වන දින දක්වා ද, නැවත වතාවක් එකී බලතල ප්‍රකාරවම 2019 පෙබරවාරි මස 07 වන දින අංක 2109/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයක් මගින් 2019 මැයි මස 30 වෙනි දින දක්වා ද දීර්ඝ කරන ලද අතර, තවදුරටත් කොමිෂන් සභාවේ වර්තමාන කාර්යභාරය සැලකිල්ලට ගනිමින් නැවත වතාවක් එකී බලතල ප්‍රකාරවම 2019 ජුනි මස 30 වැනි දින දක්වා මෙයින් දීර්ඝ කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 මැයි මස 22 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

06 - 170

1A - G 30155 — 387 (2019/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*